www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# "ආසියා-පැසිෆික් සභාවක්" සඳහා ඔස්ට්‍රේලියානු කැඳවුම: වැඩෙන ආතතිය පිළිබඳ ඇඟවුමක්

## Australian call for "Asia-Pacific Community": A sign of growing tensions

**ජෝන් චෑන් විසිනි**
**2008 ජුනි 27**

මෑතදී අගමැති කෙවින් රඩ් "ආසියා-පැසිෆික් සභාවක්" සඳහා කැඳවුම් කරමින් කල කතාව පිටුපස ඇත්තේ ප්‍රධාන කලාපීය බලවතුන් වන එක්සත් ජනපදය, චීනය, ජපානය හා ඉන්දියාව අතර පැන නැගීමට ඉඩ ඇති ගැටුම්කාරී තත්වය පිළිබඳ ඔස්ට්‍රේලියානු පාලක පන්තියේ ගැඹුරු අවධානයයි.

වසර 2020 දී කලාපීය සහයෝගිතා මන්ඩලයක් ඇති කිරීම පිළිබඳ සිය ගාම්භීර යෝජනාව, රඩ් විසින් සිඩ්නි නගරයේ තිබෙන ආසියා සමාජයට අයත් ඔස්ට්‍රල්ඒසියා මධ්‍යස්ථානයේදී ජූනි 4 දින ඉදිරිපත් කරනු ලැබිනි. ආසියාවේ සිදුවන වෙනස්කම් " ඓතිහාසික පරිමානයේ" ඒවා ලෙස විස්තර කල ඔහු මෙසේ පැවසීය. "සරල ලෙස දැක්වුවහොත් ගෝලීය ආර්ථික හා භූලෝපායික භාරය ආසියාව කරා යොමු වෙමින් තිබේ." ඔහු පැහැදිලි කල ආකාරයට 2020 වන විට ගෝලීය දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 45කටද, ලෝක වෙලදාමෙන් තුනෙන් පංගුවකටද, ලෝක මිලිටරි වියදමෙන් හතරෙන් පංගුවකටද වග කියනු ලබන්නේ ආසියාවයි. ලෝක බල ශක්ති පරිභෝජනයෙන් අඩකට වඩා ආසියාව තුල සිදුවනු ඇත. වේගයෙන් කාර්මීකරනය වන මෙම ප්‍රදේශය තුල ප්‍රක්ෂේපිත ලෝක ජනගහනය වන බිලියන 7.7 න් 4.6 ක් සිටිනු ඇත.

කෙසේ වුවද ප්‍රදේශය තුල බල ශක්තිය, අමු ද්‍රව්‍ය හා ආහාර හා පිරිසිදු ජලය පවා ක්‍රමානුකූලව පාලනය කිරීමේ ජාත්‍යන්තර සංවිධානයක් නැත. පුපුරා යාහැකි ස්ථාන ලෙස කාශ්මීරය, තායිවානය හා උතුරු කොරියාව ඔහු විසින් පෙන්වා දෙනු ලැබිනි. "ක්‍රියාත්මක නොවීමේ භයානක කම වන්නේ අපගේ ප්‍රදේශය තුල අනාගත ගැටුමක් ඇතිවීම නොවැලැක් විය හැකි බවට පවතින සංවේදනයේ ගොදුරක් බවට අප පත්වීමේ අනතුරයි."

ආසියාව සමග තිබන ආර්ථික සබඳතා මත විශාල වශයෙන් පදනම් වී සිටින නමුත් භූලෝපායික වශයෙන් එක්සත් ජනපදය සමග පශ්චාත් යුධකාලීනව පවත්වා ගෙන යන සන්ධානය මත විශ්වාසය තබා ඇති ඔස්ට්‍රේලියානු ධනවාදය මුහුන දෙන ගැටලුව රඩ්ගේ ප්‍රකාශයෙන් පැහැදිලි වෙයි. 1980 ගනන් වලදී තියුනු එක්සත් ජනපද - ජපාන ආර්ථික එදිරිවාදුකම් මධ්‍යයේ මෙම බලයයන් දෙක අතර නිරතුරුව තුලනාත්මකව ක්‍රියා කිරීමට කැන්බරාව උත්සුකවිය. 1990 ගනන් වල ජපානය තුල දිගින් දිගටම පැවති කඩා වැටීමෙන් පසු එක්සත් ජනපද - ජපාන ආතතිය යම් පමනකට ලිහිල් වූ අතර චීනයේ හා ඉන්දියාවේ නැගී ඒම මගින් කලාපීය සබඳතා සංකීර්න කෙරිනි.

ආසියා පැසිෆික් කලාපයේ වැඩෙන සංකීර්න හා ආතති සහගත එදිරිවාදුකම් මධ්‍යයේ ඔස්ට්‍රේලියාව ස්ථානගත වී ඇත. ඇමරිකානු ආධිපත්‍යයට දැවැන්තම දිගු කාලීන තර්ජනය ලෙස බුෂ් පරිපාලනය විසින් සැලකෙන චීනයට එරෙහිව ඉන්දියාව සමග සමීප භූලෝපායික සබඳතා ඇති කර ගැනීමටත් ඔස්ට්‍රේලියාව හා ජපානය සමග පවතින සබඳතා ශක්තිමත් කර ගැනීමටත් එක්සත් ජනපදය උත්සාහ දරයි. චීනයේ වේගවත් ආර්ථික වර්ධනය මගින් තමන් කොන්වීයාම පිලිබඳව ජපානයද නොසන්සුන් වී ඇත.

එම සන්දර්භය තුල අතීත හොවාර්ඩ් ආන්ඩුව ඇෆ්ගනිස්ථානය හා ඉරාකය තුල බුෂ් පරිපාලනයේ ආක්‍රමනකාරී යුද්ධයන්ට පූර්න ලෙසින්ම පිටුබලය සැපයුවද දැන් ඔස්ට්‍රේලියාවේ විශාලතම වෙලඳ සහකරු වන චීනය "සීමා කිරීමේ" වොෂින්ටන් ප්‍රතිපත්තියෙන් දුරස්ව සිටීමේ උත්සාහයක නියැලිනි. ඒ අතරම එක්සත් ජනපද නායකත්වය යටතේ චීනයට එරෙහිව යොමු කෙරුනු "ත්‍රෛ සන්ධානය" සඳහා පියවරක් ලෙස 2007 දී ජපානය සමග ඒකාබද්ධ ආරක්ෂක ප්‍රකාශනයකටද හිටපු අගමැති ජෝන් හොවාර්ඩ් අත්සන් තැබීය.

සියල්ල අලලාගත් ආසියා පැසිෆික් සභාවක් සඳහා වූ රඩ් ගේ කැඳවුම ඔස්ට්‍රේලියාවේ සියුම් තුලන කාර්යය අපහසු වීමේ තර්ජනය ඇති කරන්නා වූ ආතතීන් ලිහිල් කිරීමේ තවත් තැතකි. එනමුත් ප්‍රකාශකයින් කිහිප දෙනෙකුම පවසා ඇති අකාරයට වත්මන් එදිරිවාදුකම් මගින් මෙම සැලසුම ආරම්භයේදීම ලොප් කර දැමීමට බොහෝ සෙයින් ඉඩ ඇත. හැරත්, සැලසුම ඉදිරිපත් කල ආකාරයමත් පෙන්නුම් කරන්නේ එය කඩිමුඩියේ හා වැඩිමනත් සැලකිල්ලකින් තොරව ඉදිරිපත් කල එකක් බවය.

යෝජනාව කලාපයේ නායකයන්ට ඉදිරිපත් කිරීමේ විශේෂ නියෝජිතයා ලෙස ඔස්ට්‍රලේෂියා මධ්‍යස්ථානයේ ආරම්භක අධ්‍යක්ෂ රිචර්ඩ් වූල්කොට්, රඩ් විසින් පත් කරනු ලැබිනි. හිටපු රාජ්‍ය තාන්ත්‍රිකයෙකු හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධානියා වූ 81 හැවිරිදි වූල්කොට් හට මෙම කාර්යය පැවරුවේද අවසන් මොහොතේය. වූල්කොට් සමග සාකච්ඡා කරමින් ඔස්ට්‍රේලියානු ගුවන් විදුලිය විස්තර කලේ එකිනෙකා සමග තරග වැදී සිටින බලයයන් වන චීනය, ජපානය, ඉන්දියාව හා එක්සත් ජනපදය එකතු කිරීමේ ඔහුගේ නව කාර්යය "කල නොහැක්කක් ලෙස පෙනෙන බවයි".

ඊටත් වඩා විවේචනශීලී අයුරින් හිටපු අගමැති පෝල් කීටින් සැලසුම පිලිබඳව විස්තර කලේ අතිශයින්ම දුෂ්කර නමුත් එතරම් සුදුසු කාර්යයක් නොවන බවයි. යුරෝපීය සංගමයෙන් ඉගෙනීම පිලිබඳව රඩ් සිය කතාවේදී කල සඳහන විවේචනය කරමින් කීටින් කියා සිටියේ ආසියාව තුල යුරෝපීය සංගමය දෙසට පලමු පියවර තැබීම පවා කල නොහැකි වන බවයි. ආසියාවේ පවතින ගැඹුරු වෙනස්කම් පිලිබඳව ඔහු පැවසුවේ, "තමන්ගේ ස්වෛරීත්වය සත්‍ය ලෙසින් යලි ලබා ගැනීමට නූතන කාලයෙන් වසර 350ක් ගතවූ බව දෙවියන් දනියි - ඉන් වැඩි කොටසක් කා සමග හෝ ඔවුන් බෙදා ගනු ඇතැයි මම නොසිතමි. එමෙන්ම ජපානය ලෝකයේ පවතින අතිශයින්ම ආවරනිත ඒකසංස්කෘතික රටවලින් එකකි. එහි දේශපාලන නායකත්වය, අඩු තරමින් හිටපු අගමැතිවරයාගේ සමයේදී චීනය තුල එහි යුධ අත්දැකීම් තවමත් ස්මරනය කරමින් සිටියේය. 1930 ගනන් වලදී චීන මැංචූරියාවට කඩා පැනීමද ඊට ඇතුලත් විය."

මීට ලැබුනු හොඳම ජාත්‍යන්තර ප්‍රතිචාරය පවා ඇල්මැරුනු එකකි. චීන ආන්ඩුවේ ප්‍රකාශකයෙකු ආසියානු සභාවක් සඳහා රඩ්ගේ කැඳවුම පිලිගත් නමුත් එය තම කොන්දේසි වලට අනුකූල විය යුතු බව කියා සිටියේය. වැඩෙන අන්තර්- ආසියානු වෙලඳාම පාදක කර ගනිමින් පිම්බෙන චීන ආර්ථිකය වට කොට සන්ධානයක් ගොඩ නැගීම සඳහා බීජිනය ක්‍රියාත්මක වෙමින් සිටියි. ආතතීන්ගෙන් ඇලලී ගිය 2005 නැගෙනහිර ආසියානු සමුලුවට පසුව ආසියාන් = 3 (ගිනිකොන දිග ආසියානු ජාතීන්ගේ සංගමය සමග චීනය, ජපානය හා දකුනු කොරියාව) කන්ඩායම ඇතිවිය. එක්සත් ජනපද පිටපතක් ලෙස පුලුල්ව සැලකුනු ඔස්ට්‍රේලියාවට අසුනක් ලබා ගැනීමට පවා ප්‍රබල ප්‍රයත්නයක් දැරීමට සිදුවිය. චීන බලපෑමට මුහුන දීම සඳහා ඉන්දියාව ඇතුලත් කර ගැනීමට ජපානය උත්සුක විය. එක්සත් ජනපදය සහභාගී නොවීම විශේෂිතය.

ආසියානු සභාව පිලිබඳ සැලැස්මේ ප්‍රධාන සහායකයින් දෙදෙනෙකු ලෙස ජපානය හා ඉන්දුනීසියාව රඩ් විසින් හුවා දක්වනු ලැබිනි. නමුත් රඩ්ගේ ඉදිරි දැක්ම පිලිබඳව ජපාන අගමැති යසුවෝ ෆුකුඩා උනන්දුවක් නොදැක්වීය. ජපානය හා ආසියාන් සංවිධානය මාධ්‍ය කර ගැනුනු පැසිෆික් කලාපය පිලිබඳ සිය ඉදිරි දර්ශනය ෆුකුඩා විසින් මැයි මසදී පැවැත් වූ කතාවකදී ඉදිරිපත් කලේය. ඔස්ට්‍රේලියාවට වඩා ප්‍රමුඛත්වයක් රුසියාවට ලබා දිනි.

## ජපාන - චීන එදිරිවාදුකම්

ටෝකියෝවේ රාජ්‍ය තාන්ත්‍රික ඇනුම් පද පිටුපස ඇත්තේ කැන්බරාව වැඩි අවධානය යොමු කරන්නේ බීජිනයට බවයි. එක්සත් ජනපදය, යුරෝපය හා චීනයට කල සිය පලමු ප්‍රධාන ලෝක සංචාරය තුලදී ඔස්ට්‍රේලියාවේ දෙවන විශාලතම වෙලඳ සහකරු වන ජපානය මග හැරීම පිලිබඳව ඔස්ට්‍රේලියානු ජන මාධ්‍ය රඩ් හට දෝෂාරෝපනය කලේය. මෙම මග හැරීම ජපානයේ අවධානයටද යොමු නොවුනා නොවේ.

පසුගිය නොවැම්බරයේ මැතිවරනය ජයග්‍රහනය කිරීමට බොහෝ පෙර සිටම, එක්සත් ජනපද නායකත්වය යටතේ සිදු කල ඉරාක හා ඇෆ්ගනිස්ථාන ආක්‍රමන තුල කැන්බරාවේ සහභාගිත්වයද ඇතුලත් එක්සත් ජනපද සන්ධානයට සිය පූර්න කැපවීම රඩ් ප්‍රකාශයට පත් කලේය. "එක්සත් ජනපදය සමග අප සන්ධානය අපගේ විදේශ පිලිවෙතේ පලමු කුලුන වන අතර අපගේ විදේශ හා ආරක්ෂක පිලිවෙතෙහි මූලෝපායික අත්තිවාරමද වේයැ"යි ඔහු සඳහන් කලේය.

ඒ අතරම කෙසේ වෙතත් චීනය සමග සබඳතා වැඩි දියුනු කර ගැනීමටද රඩ් ප්‍රවේසම් සහගත විය. පසුගිය වසරේ ජපානය සමග ආරක්ෂක ගිවිසුමක් අත්සන් කිරීමට හොවාර්ඩ් ගත් තීන්දුව චීනය විරුද්ධ කර ගැනීමක් විය හැකි යැයි ඔහු අදහස් පල කලේය. චීනය තුල "ලූ කෙවෙන්" නමින් හැඳින්වෙන හොඳින් මැන්ඩරින් භාෂාව හැසිරවිය හැකි රඩ් තමාව හඳුන්වා ගන්නේ බටහිර හා බීජිං අතර පාලමක් ලෙසිනි. රඩ්ගේ බලයට පත්වීම ටෝකියෝවේදී පැහැදිලි කෙරෙන්නේ චීන බලපෑම වර්ධනය වීමක් ලෙසය. මොහුගේ තේරී පත් වීමෙන් පසුව ජැපෑන් ටයිම්ස් මෙසේ ලීවේය: "ඔහුගේ 'චීන සම්බන්ධය' නිසා ජපාන විදේශ පිලිවෙතේ විශේෂඥයින් අසා සිටියේ ජපානය පරයමින් දැන් සයිනො-ඔස්ට්‍රේලියා සබඳතා පෙරට පැමිනේද යනුවෙනි."

මැතිවරනයෙන් සති කිහිපයක් තුලදීම නව ලේබර් ආන්ඩුව දකුනු පැසිෆික් සාගරයේ ජපාන තල්මස් කන්ඩායම් අධීක්ෂනය කිරීම සඳහා රේගු යාත්‍රා යැවීම ටෝකියෝවේදී ප්‍රකාශයට පත් වූයේ තල්මස් දඩයම් විරෝධීන් උනන්දු කිරීමක් ලෙසය. තල්මස් දඩයම් සම්බන්ධයෙන් ජපානය ජාත්‍යන්තර අධිකරනයට ගෙන යන බවට පවා රඩ් තර්ජනය කලේය.

ආසියා-පැසිෆික් සභාවක් සඳහා කල කැඳවුමෙන් යන්තම් දින කිහිපයකට පසුව ජූනි 8 - 12 දක්වා රඩ් ජපාන සංචාරයකට සහභාගි වූයේ ටෝකියෝවේ ප්‍රශ්න නිරාකරනය කර ගනිමින් ද්විපාර්ෂවික සබඳතා ප්‍රතිසංස්කරනය කර ගැනීමේ උත්සාහයකටය. තල්මස් දඩයම පිලිබඳව ජපානය ජාත්‍යන්තර අධිකරනය වෙත ගෙන යාමට කල තර්ජනය ඉවත් කර ගත් ඔහු මතභේදය රාජ්‍යතාන්ත්‍රික ලෙස විසදා ගැනීමට ක්‍රියා කරන බව පැවසීය. 1945 දී එක්සත් ජනපද න්‍යාෂ්ඨික බෝම්බයෙන් විනාශයට පත්වූ හිරෝෂිමාවට ප්‍රථමයෙන් පිවිසීම මගින් න්‍යෂ්ඨික පැතිරවීම වැලැක්වීමේ උත්සාහයට ජපානය සමග ඒකාබද්ධ වීමේ ඔස්ට්‍රෙලියානු කැමැත්ත ඔහු ප්‍රකාශයට පත් කලේය. " හිරෝෂිමාවෙන් ඉගෙන ගත යුතු අප න්‍යාෂ්ඨික පැතිරීම වැලැක්වීමේ හා න්‍යාෂ්ඨික අවි වලින් නිදහස් වූ අනාගත ලෝකයක් පිලිබඳ ප්‍රශ්නයට ගෝලීයව මුහුන දිය යුතුයැ"යි ඔහු කියා සිටියේය.

කෙසේ වුවද "න්‍යාෂ්ඨික පැතිරීම වැලැක්වීම" ලඟ දෙන්නේ ප්‍රචන්ඩත්වයේ නව ක්‍රියාවන් සඳහා වේදිකාව සැකසීමටය. වඩාත්ම ක්ෂනිකව මෙය ඉරානයට එරෙහිව යෙදවේ. එක්සත් ජනපදය හා ජපානය උතුරු කොරියාවේ න්‍යාෂ්ඨික ටැඩ සටහන්ද යොදා ගනිමින් ඊසාන දිග ආසියාවට බලපෑම් යොදන්නේ ජ්‍යොන්ග්යන්ග්හි ප්‍රධාන සහායකයා වන චීනයට වක්‍රව පීඩනය යොදමිනි. එබැවින් ජපානයේ "න්‍යාෂ්ඨික විරෝධී" ආස්ථානයට රඩ් සහය පල කිරීම සුවිශේෂවම ඊසාන දිග ආසියාවේ වැඩෙන ජපාන බලපෑම සඳහා රාජ්‍ය තාන්ත්‍රික සහය පල කිරීමකි.

ආසියාවේ ස්ථාවරත්වය සඳහා ජපානය, ඔස්ට්‍රෙලියාව හා එක්සත් ජනපදය අතර ත්‍රෛයිපාක්ෂික සහයෝගය ඇති කර ගැනීමේ වැදගත්කම රඩ් හා ෆුකුඩා ඔවුන්ගේ ජූනි 12 රැස්වීමේදී අවධාරනය කලහ. යථා වශයෙන් ගත් කල ත්‍රෛපාක්ෂික සන්ධානය චීනය සමග ආතතිය ඉහල දමයි. ටෝකියෝවට යාමට පෙරාතුව රඩ් මෙසේ පැවසීයඃ "මා විශ්වාස කරන ලෙසට ඔස්ට්‍රෙලියා - ජපාන සම්බන්ධතාව පිලිබඳ තීරනාත්මක කරුන වන්නේ එය දේශපාලන බෙදුම්කඩනයන් ඉක්මවා යන බවයි. එක්සත් ජනපදය සමග අපගේ සම්බන්ධතාව තුල වෙනස්කම් දරා සිටින අයුරින්ම මෙම සම්බන්ධතාවටද වෙනස්කම් දරා සිටිය හැකිය."

ජූනි 14 දින ඔස්ට්‍රෙලියන් මෙසේ සඳහන් කලේයඃ "මෙම සතිය තුල ඔස්ට්‍රෙලියානුවන්ට පැහැදිලි වූයේ, ෆුකුඩා හා ඊට පෙර ෂින්සො අබෙ බීජිං තන්ත්‍රය සමග ඔවුන්ගේ දේශපාලන සබඳතා අලුත්වැඩියා කර ශක්තිමත් කිරීමට විශාල වෙහෙසක් ගත්තද, චීනය සමග සම්බන්ධතා පවත්වන සිය මිතුරන් හා සගයන් පිලිබඳව ජපානයේ සැම තිල මට්ටමකම පවතින අතිශය තීක්ෂන බාවයයි... එනමුදු ආහාර හා බල ශක්තිය සඳහා විදේශ වලින් සම්පත් ලබා ගැනීමේදී හා ආසියා පැසිෆික් ප්‍රදේශයේ ඉතිරි කොටසේ සිය රාජ්‍ය තන්ත්‍රික බලපෑම සඳහා, ජපානය හා චීනය අතර තරගය ඉහල යාම ෆුකුඩාගෙන් පසු කිසිවෙකු ප්‍රතික්ෂේප කරන්නේ නැත. ජපාන රාජ්‍ය තාන්ත්‍රික කතාව අවංකව කිවහොත් චීන බලයට එරෙහිව වැට බැඳීමක් වන අතර ඔස්ට්‍රෙලියාව එම වැට බැඳීමේ ක්‍රියා මාර්ගයේ කොටසක් වීම බලාපොරොත්තුවයි."

බල ශක්ති හා ආහාර සුරක්ෂිතතාව පිලිබඳ ප්‍රශ්නය සංචාරය තුල ලඟ දුන් මූලික ප්‍රශ්නයක් විය. කියතෝ විශ්ව විද්‍යාලයේ කල කතාවකදී ග්‍රීන්හවුස් වායූන් කපා හැරීම සඳහා කියතෝ ගිවිසුම අනුමත කිරීමට ඔහුගේ ආන්ඩුව ගත් තීන්දුව ඔහු උත්කර්ෂයට නැංවීය. එසේ වුවද ශිෂ්‍ය ප්‍රශ්න එල්ල කෙරුනේ භාන්ඩ ආනයනය මත විශාල වශයෙන් පදනම් වුවත් තවමත් ලෝකයේ දෙවන විශාලතම ආර්ථිකය වන ජපානයට බල ශක්තිය හා ආහාර සැපයීමට ඔස්ට්‍රෙලියාවේ පවතින කැපවීම පිලිබඳවයි. පරදුවට තැබී ඇති ප්‍රශ්නය වන්නේ යම් අවස්ථාවකදී ඔස්ට්‍රෙලියානු ඛනිජ හා කෘෂිකාර්මික අපනයනකරුවන් ජපානය පාවාදී චීනයට හැරෙනු ඇති බවයි.

බල ශක්තිය සඳහා සයිනො-ජපාන තරගය මගින් දැනටමත් දේශ සීමා මතභේද ඇවිස්සී ඇත. මත භේදයට ලක්වූ නැගෙනහිර චීන මුහුදේ ගෑස් බිම් ඒකාබද්ධව වර්ධනය කිරීමේ ගිවිසුමකට දිග්ගැසුනු කේවල් කිරීම් වලින් පසුව පසුගිය බදාදා රටවල් දෙක අත්සන් තැබීය. ගිවිසුම අහෝසි කරන ලෙස ක්ෂනිකවම චීනය තුල ජපන් විරෝධී උද්ඝෝෂන කුලු ගැන්විනි. රඩ්ගේ සංචාරය සිදුවෙමින් පවතින අතරතුරේදී ජපාන මුහුදු මුර සංචාරක නැවක් මතභේදයට තුඩු දී ඇති නැගෙනහිර චීන මුහුදේ ඩයෝයු දිවයින අසලදී වුවමනාවෙන්ම තායිවාන මසුන් මරන බෝට්ටුවක් හප්පා ගිල්ලවීම නිසා තායිවානය හා ජපානය අතර රාජ්‍ය තාන්ත්‍රික ගැටුම් මාලාවක් පැන නැගිනි. ජපාන ක්‍රියාවට විරෝධය පල කිරීම සඳහා එම ප්‍රදේශයට යුධ නැව් යවන බවට බීජිංහි පිටුබලය සහිතව තායිවානය තර්ජනය කලේය. ටෝකියෝව පසුව කනගාටුව පල කලද අභ්‍යන්තර ආතතිය එලෙසම පවතී.

බ්‍රිතාන්‍යයේ පදනම් වී ඇති ඉකොනොමිස්ට් සගරාවේ හිටපු කතුවරයා වූ බිල් එමොට් ගේ නව පොතෙහි ආසියාවේ මූලෝපායික එදිරිවාදුකම් පලමු ලෝක යුද්ධයට පාර කැපූ දහ නව වන සියවසෙහි යුරෝපයට සමාන කර ඇත. "ආසියාවේ නැගීම හුදෙක් හෝ ප්‍රධාන වශයෙන් බටහිර බලය ආසියාවට මාරු කරමින් ආසියාව බටහිරට එරෙහිව යෙදවීමක් නොවේ. එමගින් ආසියානුවන්ට එරෙහිව ආසියානුවන් පිහිටවේ. බලවතුන් තිදෙනෙකු එනම් චීනය, ඉන්දියාව හා

ජපානය ආසියාව තුල සිටින ඉතිහාසයේ පලමු අවස්ථාව මෙයයි. ඔවුන් එකිනෙකාට කැමති නම් හෝ ස්වාභාවිකවම යම් අයුරකින් ගැලපේ නම් ප්‍රශ්නයක් නැත. නමුත් ඔවුන් එසේ නොවන අතර

යථා වශයෙන් ගත් කල ඊට බොහෝ දුරස්ථය." (බිල් එමොට්, *විරුද්ධවාදීන්: චීනය, ඉන්දියාව හා ජපානය අතර බල අරගලය අපගේ මීලග දශකය හැඩ ගන්වන්නේ කෙසේද*, ඇලන් ලේන් 2008 පි 8)

යුරෝපයේ මෙන්ම ආසියා පැසිෆික් කලාපය තුලද සාපේක්ෂ පශ්චාත් යුධ කාලීන ස්ථාවරත්වය පදනම් වූයේ එක්සත් ජනපදයට පැවති දැවැන්ත ආර්ථික හා දේශපාලන ආධිපත්‍ය මතය. දෙදරා හැලුනු ජපන් ආර්ථිකය යලි ගොඩනැංවීමට එක්සත් ජනපදය උදව් කල අතර 1952දී අත්සන් තැබූ එක්සත් ජනපද - ජපාන ආරක්ෂක ගිවිසුම පැසිෆික් කලාපය තුල වොෂින්ටනයේ ප්‍රතිපත්තිය පිලිබඳ මූලික ප්‍රතිෂ්ඨාව විය. කොරියාව හා වියට්නාමය තුල එක්සත් ජනපද නායකත්වයෙන් දියත් වූ ආක්‍රමනකාරී යුද්ධ වලදී ප්‍රධාන සැපයුම් මධ්‍යස්ථානය වූයේ ජපානයයි. ඇමරිකානු න්‍යෂ්ඨික ආවරනයේ සෙවන ලබා ගැනීමට හිලව් ලෙස එක්සත් ජනපදයේ දෙවන පෙලේ සහායක කාර්යභාරය ජපානය විසින් පිලිගනු ලැබිනි.

1990 ගනන් වල මුලදී සීතල යුද්ධය අවසාන වීම විසින් ඇති කරනු ලැබූ තියුනු බල අරගලය පැසිෆික් කලාපයද අලලා ගත්තේය. සිය ආර්ථික බලාධිකාරය නැතිවීයාමත් සමග තම ආධිපත්‍ය පවත්වා ගෙන යාම සඳහා අවශිෂ්ට මිලිටරි බලය යොදා ගැනීමට එක්සත් ජනපදය උත්සාහ කලේය. ඉරාකයේ හා ඇෆ්ගනිස්ථානයේ යුද්ධ හරහා සම්පත් බහුල මැද පෙරදිග හා මධ්‍යම ආසියාව වැනි කලාප වල පාලනය අත්පත් කර ගැනීමේ නියැලෙන අතරම චීනය වට කිරීම ඉලක්ක කර ගැනෙන රටවල් සමග සඹදතා වැඩි දියුනු කර ගැනීමේද බුෂ් පරිපාලනය යුහුසුලුව යෙදී සිටියි.

එම මූලෝපායේ කොටසක් ලෙස ඊසාන දිග කලාපය තුල තම වුවමනාවන් වඩා ප්‍රචන්ඩකාරී ලෙස ඉටු කර ගැනීමට වොෂින්ටනය විසින් ටෝකියෝව උනන්දු කරවනු ලැබීම මගින් චීනය සමග පමනක් නොව තායිවානය හා දකුනු කොරියාව සමගද ආතතීන් පැන නැගී තිබේ. එක්සත් ජනපද තර්ජනයට ප්‍රතිචාර ලෙස රුසියාව සමග සමීප සබදතා ඇති කරගනිමින් ඒකාබද්ධ මිලිටරි ව්‍යායාමයන් පැවැත්වීම චීනය ආරම්භ කලේය. වොෂින්ටනයේ ආලවට්ටම් තිබුනද චීනයට එරෙහිව සරල එක්සත් ජනපද මෙවලමක් බවට පත් නොවීමට නව දිල්ලිය පරෙස්සම් සහගතය. ඒ අතරම දකුනු ආසියාවේ ආධිපත්‍යධාරී බලය බවට පත් වීමට තිබෙන සිය වුවමනාවන්ට පවතින බාධකයක් ලෙසද ප්‍රතිමල්ලවයකු ලෙසද ඉන්දියාව විසින් චීනය සලකනු ලබයි.

වැඩි වශයෙන් ඔස්ට්‍රේලියානු ධනවාදයට ගැලපෙන ආකාරයට සියලු දෙනාටම වට මේස සාකච්ඡාවකින් තම තමන්ගේ වෙනස්කම් විසදා ගත හැකි ආසියා පැසිෆික් සභාව පිලිබඳ යෝජනාව රඩ් විසින් ගෙන එනු ලැබ ඇත්තේ මෙම කැකෑරෙන කල්දේරම තුලටය. ජාත්‍යන්තරවත් ආසියාවේත් යථාර්තය වන නව යුද්ධ හා ගැටුම් දෙසට ගමන් කිරීම සමග මෙම යෝජනාව පිටුපස ඇති ප්‍රාර්තනාවන්ට ඇත්තේ ඉතා ලිහිල් සම්බන්ධයකි.

© www.wsws.org